**මහව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 නොවැම්බර් 15 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.105,000 ක් වූ ඉඩම් 06 ක වටිනාකම දෙවරක් ගිණුම් ගත කර තිබුණි.

(ආ) මහව වෙළඳ සංකීර්ණය සහිත ඉඩම සහ අඹන්පොල ප්‍රාදේශීය සභා උප කාර්යාලය සහිත ඉඩම පිළිවෙලින් රු.2,595,000 ක් හා රු.2,157,967 ක් වුවද, එකතු වටිනාකම රු.22,487,967 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් 44 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සභාව සතු රු.1,060,000 ක් වූ ට්‍රැක්ටරයක වටිනාකම රු.240,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ලී බඩු හා උපකරණ විෂයයන් 14 ක රු.336,955 ක් වූ අගය රු.73,781 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) රු. 493,062 ක් වූ පෙර පාසල් උපකරණ විෂයයන් 04 ක්, උප කාර්යාලවල රු.486,305 ක වත්කම් හා මහව මහජන පුස්තකාලයේ රු.369,600 ක පොත් වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.82,077 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ විවිධ ද්‍රව්‍ය තොග අගය රු.699,340 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) රු.18,200 ක් වූ වෝටර් මැන් ජල මනු 14 ක අගය රු.186,200 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,337,411 ක් වූ ස්ථාවර තැන්පතු රු.2,902,735 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) 2015 වර්ෂයට අදාල රු.2,500,000 ක මුද්දර ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ රු. 54,237,684 ක් සහ 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.20,209,015 ක් පිළිවෙලින් රු.55,960,877 ක් හා රු.10,632,875 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ග) පෙර වර්ෂයට අදාල රු.358,308 ක වැටුප් ප්‍රතිපූර්ණ සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂය අවසානයට රු.583,208 ක් වූ නොපියවූ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල රු.518,908 ක් ලෙස දක්වා තිබුණි.

(ට) ගිණුම් අතර මුදල් මාරු කිරීමේ ගිණුමේ රු.22,908 ක වෙනස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේ ගෙවා තිබුණු විගණන ගාස්තු රු.99,084 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(න) 2017 දෙසැම්බර් 31 දිනට රු.17,603,889 ක් වූ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.18,117,589 ක් ලෙස දක්වා තිබුණි.

(ත) ඉකුත් වර්ෂවලදී ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු රු. 80,608 ක් සමාලෝචිත වර්ෂයේදී හිඟ වෙනත් ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ද) සමාලෝචිත වර්ෂයට ලැබියයුතු රු.4,183,750 ක් වූ හිඟ උසාවි දඩ මූල්‍ය ප්‍රකාශනවල රු.1,295,000 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපලේඛනවල ශේෂයන් අතර, රු.50,050,109 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පත් ලේඛනය අනුව රු.6,005,963 ක් වූ තැන්පත් මූල්‍ය ප්‍රකාශනවල රු.10,455,296 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

i. සමාලෝචිත වර්ෂය අවසානයට රු.54,355,842 ක් වූ ණයගැතියන්ගෙන් රු.35,108,292 කට කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

ii. තොරතුරු නොමැති රු.6,666,978 ක අත්තිකාරම් ශේෂයක් හා අධිකාරියකින් ලැබිය යුතු රු.761,854 ක් නිරවුල් කරගත නොහැකිව දිගු කාලයක් තුළ පැවතුණි.

iii. 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.6,898,986 ක් අයකර ගත යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

i. 2017 දෙසැම්බර් 31 දිනට රු.55,750,084 ක් වූ ගෙවිය යුතු ගිණුම් වලින් රු.51,668,018 කට කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ii. වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු.3,930,687 ක් නිරවුල් කිරීමට පැවතුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,455,295 ක් වූ තැම්පත් වලින් ආපසු ගෙවියහැකි තැම්පත් හඳුනාගෙන ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතුකර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.46,107,398 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1986 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | (i) 5.6.1 (අ) මාර්ගෝපදේශය | 145,241 | පිරිවිතර ලබා දීමකින් තොරව මිළදී ගැනීම් සිදුකර තිබුණි. |
| | (ii) 6.3.3 (ආ) මාර්ගෝපදේශය | 597,200 | මිළ ගණන් කැඳවීමේදී විවෘත කරන දිනය, වේලාව සහ ස්ථානය සඳහන් කර නොතිබුණි. |
| (ඇ) | 1992 අගෝස්තු 09 දිනැති 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු ධාවන තත්ත්වයේ වූ වාහන 13 ක රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගනක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,884,906 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.12,341,209 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

සභාව විසින් චෙක්පත් නිකුත් කිරීමේදී සිදු වූ වැරදි එක් එක් මාසයන්හීදී නිවැරදි නොකිරීම හේතුවෙන් රු.136,826 ක වටිනාකමක් බැංකු සැසඳුම් ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| (i) වරිපනම් හා බදු | 4,990 | 5,772 | 5,070 | 3,036 | 5,290 | 5,502 | 5,773 | 2,334 |
| (ii) බදු කුලී | 12,875 | 11,068 | 11,304 | 134 | 11,725 | 11,517 | 11,510 | 370 |
| (iii) බලපත්‍ර ගාස්තු | 846 | 919 | 919 | - | 746 | 901 | 901 | - |
| (iv) වෙනත් ආදායම් | 111,488 | 71,309 | 79,285 | 13,490 | 101,937 | 59,333 | 59,149 | 21,461 |
| එකතුව | 130,199 | 89,068 | 96,578 | 16,660 | 119,698 | 77,253 | 77,333 | 24,165 |

සටහන

2016 සහ 2017 වර්ෂවල රැස්කළ ආදායම් තුළ පසුගිය වර්ෂවලට අදාල හිඟහිටි ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයට රුපියල් මිලියන 130 ක ආදායමක් ඇස්තමේන්තුගත කර තිබුණද, වර්ෂයේ බිල් කිරීම් රුපියල් මිලියන 89 ක් විය. පෙර වර්ෂයන්ට අදාල හිඟ ලැබීම් ද සමඟ රුපියල් මිලියන 97 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 24 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය අවසානයේ දී රුපියල් මිලියන 17 ක් දක්වා අඩු වී තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

**-----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා බලප්‍රදේශයේ වරිපනම් ඒකක 1556 කින් රු.2,827,256 ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවති අතර 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33-42 ප්‍රකාරව හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයන් 210 කගෙන් රු.314,822 ක් වූ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සභා බලප්‍රදේශයේ ව්‍යාපාර ඒකක 83 කින් හා කර්මාන්ත ඒකක 17 කින් පිළිවෙලින් රු.152,040 ක හා රු.16,500 ක බදු අයවිය යුතුව පැවතුණි.

**2.3.4 කුලී**

**-----**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර 05 කින් රු.40,109 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.93,122 ක් වූ හිඟ බදු කුලී අයවිය යුතුව තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ සහ මුද්දර ගාස්තු වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එම එකතුව රු.1,874,642 ක් විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යය සාධනය**

**-----------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් අමාත්‍යවරයා විසින් සාදන ලද පොදු අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන තිබුණි.

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

--------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත රු.3,340,522 ක් වූ කර්මාන්ත 02 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අඹන්පොල නගරයේ රැස් කරන කසළ අමුණුගම ප්‍රදේශයේ ඉඩමකට බැහැර කරමින් තිබූ අතර පුද්ගලයින් විසින්ද අනවසරයෙන් මෙම භූමියට කසළ බැහැර කරන තත්ත්වය තුළ වීදුරු කැබලි, මාළු අලෙවිසැල්වල අපද්‍රව්‍ය මෙම භූමියේ තැනින් තැන දමා තිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට 2017 වර්ෂයේදී රැස් කර තිබුණු දිරන කසළ ටොන් 490 ක ප්‍රමාණයකින් ටොන් 140 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගන්නා අතර, ඉතිරිය විවෘත භූමියකට බැහැර කරමින් පැවතුණි.

(ඈ) පාරිසරික ගැටළු

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අමුණුගම භූමියට බැහැර කරන පොලිතීන් වැනි නොදිරන ද්‍රව්‍ය භූමි ප්‍රදේශය තුළ දැමීමෙන් හා ගිණි තැබීමෙන් පාරිසරික ගැටළු ඇතිවිය හැකිව තිබුණි.

(ii) සියෝදාගම කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කම්බිවැට වන අලි කඩාදමා තිබුණු අතර, අමුණුගම භූමියේ කසළ වන සතුන් ආහාරයට ගැනීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණි. කසළ බැහැර කරන භූමි වලට පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණ ද දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගෙන සභාව විසින් සේර, දෙහි සහ දොඩම් වගා කිරීමේ ව්‍යාපෘති, කිරිගව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම පානීය ජල පහසුකම් ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුලා ප්‍රකාශනවල වසර ගණනාවක සිට දැක්වෙන රු. 541,322 ක් වූ බස්නැවතුම්පොළ ඉදිකිරීමේ තොග භෞතිකව හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අස්ථානගත රු.26,223 ක් වූ පොත් 185 ක පාඩුව අයකරගෙන නොතිබුණි.

(ඇ) වාහන අළුත්වැඩියාවලදී ඉවත් කරන අමතර කොටස් ලේඛනගතකර සභාවට භාරගෙන නොතිබුණි.

(ඈ) උප කාර්යාල, පුස්තකාල, ජල පෙරණ කාමරය හා පෙර පාසල්වල ස්ථාවර වත්කම් වටිනාකම් තක්සේරු කර නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

(i) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ තෘතීයික තනතුරක්, ද්විතීයික තනතුරුවල 10 ක් සහ ප්‍රාථමික තනතුරුවල 11 ක් පුරප්පාඩුව පැවතුණු අතර ද්විතීයික තනතුරක දෙදෙනෙක් සහ ප්‍රාථමික තනතුරක එක් අයෙක් අතිරික්තව පැවතුණි. තවද පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සංවර්ධන නිලධාරීන් 19 ක් සභාවට අනුයුක්ත කිරීම නිසා සංවර්ධන නිලධාරී 07 දෙනෙකු අතිරික්තව පැවතුණි.

(ii) පෙර පාසල් සහායක 18 ක්, පුස්තකාල සහායක 06 ක්, කාර්යාල කාර්ය සහායක 03ක් හා මුරකරු 02 ක් අනුමත කර ගැනීමකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(iii) දිනකට අවම වශයෙන් සේවකයන් 10 දෙනෙකු පමණ අවශ්‍ය වන කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු සඳහා සේවකයන් 03 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි.

(ආ) සේවක ණය

ස්ථාන මාරුවීම, සේවය හැරයාම, වැඩ තහනම් කිරීම, මිය යාම වැනි හේතු මත නිලධාරීන් 12 දෙනෙකුගේ වසර 01 ත් වසර 13 ත් අතර කාලයකට අදාළ රු.352,466 ක සේවක ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේදී දේපළ තක්සේරු කිරීමෙන් පසු 2014 සිට 2017 දෙසැම්බර් දක්වා අනුකූලතා සහතික නිකුත් කර තිබූ දේපළ 125 කින් වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවම ලංසු එකතුව රු.1,086,104 ක බදු දේපළ 05 ක් සමාලෝචිත වර්ෂයේ දී ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අඹන්පොල බස් නැවතුම්පල කඩ කාමර 09 ක් සහ කිරිහලක්ද, මහව පොදු වෙළඳපොල කඩ කාමර 14 ක් ද වසර 03 කට වැඩි කාලයක සිට බදු දී නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

--------------------------

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

---------------------------------

සියෝදාගම සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම සඳහා පී.එස්.45 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

**3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

--------------------------------------

වසර 10 කට පමණ පෙර කොන්ක්‍රීට් කර තිබුණු අඹන්පොල අමුණුගම මාර්ගයේ මීටර් 200 ක පමණ කොන්ක්‍රීට් කොටස් ගැලවී පාදමේ කළුගල් මතුවී මාර්ගය භාවිතා කිරීමේ අපහසුතාවය සම්බන්ධයෙන් වූ ඉල්ලීම් සභාව විසින් ඉටුකර නොතිබුණි.

**3.5.3 පවරා නොගත් වත්කම්**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ කටයුතුවලට පාවිච්චි කරන වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අඹන්පොළ නගරයේ කසළ බැහැර කරන අමුණුගම රජයේ ඉඩම සභාවට පවරා ගැනීමේ කටයුතු නිම වී නොතිබුණි

**3.5.4 නිශ්ක්‍රීය වත්කම්**

----------------

සභාව සතු රු.771,700 ක් වූ වාහන 07 ක් වසර ගණනාවක සිට නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

------------------

පළාත් ගිණුම් කාරක සභා වාර්තාවල නිශ්චිතව සඳහන් කර නොතිබියදී රු.280,713 ක හිඟ බදුකුලී හා රු.7,333 ක හිඟ කඩකුලී සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.7.2 සැපයීම් හා සේවා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව අවම මිල ඉක්මවා රු.80,000 ක් වැඩියෙන් ගෙවා සභාවේ කැබ් රථයකට ටයර් 04 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටු තීරණයක් ලබා දී තිබුණි.

(ආ) නිශ්චිත හේතු සඳහන් කිරීමකින් තොරව අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කර වෙනත් ආයතනයකින් රු.49,485 ක් වැඩියෙන් ගෙවා පෙරටු කාර්යාලයට පුටු 23 ක් මිලදීගෙන තිබුණි.

**3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය**

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශ සහ එකී චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය පහසුකම්, පළපුරුද්ද පිළිබඳ සනාථ සහ ලිපිලේඛන අනුව යෝග්‍යතාව සමාලෝචනය කිරීමකින් තොරව රු.8,654,738 ක් වූ කර්මාන්ත 11 ක් ප්‍රජා පාදක සංවිධාන වලට ලබාදී තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 02 ක හා වියදම් විෂයයන් 06 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර, සියයට 33 සිට 282 දක්වා විචලතාවක් සිදුවී තිබීම මත අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ) අයවැයගත නොකළ රු.11,054,847 ක් වූ කර්මාන්ත 16 ක් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර තිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත නොකිරීම හා ගිණුම්ගත නොවීම් පැවතීම.<br>(ii) ස්ථාවර තැන්පතු පොලී ගිණුම්ගත නොකිරීම.<br>(iii) ආදායම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම හා අඩුවෙන් ගිණුම්ගත කිරීම.<br>(iv) නොසැසඳුණු ගිණුම් නිවැරදි නොකිරීම.<br>(v) පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම හා පවත්නා ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ආ) ආදායම් පාලනය | (i) ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම.<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.<br>(ii) වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (i) කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම.<br>(ii) අයවැය ගත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම.<br>(iii) අයවැයගත නොවූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| (ඉ) ණයගැති/ණයහිමි පාලනය | (i) ලේඛන පවත්වා නොතිබීම.<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඊ) අයවැය පාලනය | ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලතාවයන් පැවතීම. |